# ගම්මන්පිලට අපහාස කළාට රුපියල් බිලියනයක වන්දි ඉල්ලා පොලිසියට නඩු

2026 ජූනි මාසේ 6 වෙනිදා අපි මාධ්‍ය හමුවක් පවත්වමින් සුරේෂ් සලේ මැතිතුමාට පොලිසිය විසින් කරනු ලබන වදහිංසා පිළිබඳ රටට හෙළිදරව්වක් කළා. අපි මාධ්‍ය හමුව පවත්වලා පැය කීපයක් ඇතුළත පොලිස් මාධ්‍ය කොට්ඨාසය නිවේදනයක් නිකුත් කරමින් මම කියන්නේ බොරුයි කියලා රටට කිව්වා.හැබැයි, මේ වන විට අපි කිව්වේ ඇත්තයි, පොලීසිය කියන්නේ බොරුයි කියන එක හෙළිදරව් වෙලා හමාරයි.

ජූනි 6 වෙනිදා මාධ්‍ය හමුවේදී අපි නිශ්චිත කාරණා හතරක් මතු කරා. පළවෙනි කාරණය තමයි, 13 දෙනෙක් ඉදිරියේ සලේ මැතිතුමාව නිරුවත් කර ගුද මාගර්ය පරීක්ෂා කළා කියන එක. දෙවැනි කාරණය, ඔහුව වාතාශ්‍රය නොමැති අඳුරු කුඩා කාමරයක, අඩි 6x4 කුඩා කාමරයක සිරගත කර ඉන්න බව. තුන්වෙනි කාරණය, ඔහුට නිසි ආහාර ලබා නොදෙන බව. හතරවන කාරණය, ඔහුව නිරුවත් කර පහර දුන් බව.

දැන් මේ කාරණාවලින්,පළවෙනි කාරණය වුණු 13 දෙනෙක් ඉදිරියේ නිරුවත් කර පරීක්ෂා කළා කියන කාරණය තමන් විසින් සිදු කළ බව පොලීසිය විසින් මානව හිමිකම් කොමිසම ඉදිරියේ පිළිගැනීමක් සිදු කරලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි, ඒක සිදුකළ දිනය මාතර්ු මාසේ 8 වෙනිදා කියලත් ඒ අය සඳහන් කරලා තියෙනවා.

ඒ වගේම අපි දෙවැනියට සඳහන් කළ වාතාශ්‍රය නොමැති කුඩා කාමරයක, අඳුරු කාමරයක සිරකර සිටියා කියන කාරණය මානව හිමිකම් කොමිසම විසින් කරනු ලැබූ නිරීක්ෂණ චාරිකාවේදී තහවුරු වෙලා තිබෙනවා. ඒ වගේම වෛද්‍ය වාතර්ාවේ, ඔහු අඳුරු කාමරයක දිගින් දිගටම සිටිය නිසා සිටීමේ ප්‍රතිඵලයක් වන, හිරු එළියට නිරාවරණය නොවීමේ ප්‍රතිඵලයක් වන විටමින් D ඌනතාවයට මුහුණ දී තිබෙනවාය කියන කාරණය වෛද්‍ය වාතර්ාවෙනුත් තහවුරු වෙලා තිබෙනවා. ඒ වගේම, උසින් වැඩි සුරේෂ් සලේ මැතිතුමාව අඩි 6x4 කාමරයක සිර කර සිටි බවත් මානව හිමිකම් කොමිසම තමන්ගේ නිරීක්ෂණ චාරිකාවේදී තහවුරු කරගෙන තිබෙනවා.

එහෙම බැලුවම, අපි සඳහන් කළ තුන්වෙනි කාරණය වන නිසි ආහාර ලබා නොදෙන බවට කළ චෝදනාව අධිකරණ වෛද්‍ය වාතර්ාවෙන් තහවුරු වෙලා තිබෙනවා. මොකද ඒ අධිකරණ වෛද්‍ය වාතර්ාවේ තියෙනවා සුරේෂ් සලේට ප්‍රමාණවත් ප්‍රෝටීන් ලැබිලා නැහැ, එළවළු ලැබිලා නැහැ, පළතුරු ලැබිලා නැහැ කියන කාරණය.

එතකොට තවම සනාථ නොවුණේ, නිරුවත් කර පහර දුන්නා කියන කාරණය පමණයි. හැබැයි, මේ නිරුවත් කරලා පහර දුන්නා කියන කාරණය පිළිබඳ මතු කළ අවස්ථාවේදීම ඔහුගේ ශරීරය පරීක්ෂා කළා නම් සමහරවිට මේ කාරණය හෙළිදරව් වෙන්න තිබුණා. එහෙමත් නැතිනම් සීසීටීවී (CCTV) දශර්න පරීක්ෂා කළා නම් හෙළිදරව් වෙන්න තිබුණා.

මම කියන්නේ බොරුයි කියලා පොලීසිය කිව්වම මම පොලීසියට අභියෝග කළා, සුරේෂ් සලේ මැතිතුමා කියනවා තමන්ට හිරිහැර වදහිංසා කළේ සීසීටීවී කැමරා අටක් තියෙන ස්ථානයක කියලා. මේ කියන්නේ බොරු නම්, ඒ කැමරාවල දශර්න ප්‍රසිද්ධ කරන්නයි කියලා අපි පොලීසියට අභියෝග කළා. හැබැයි මේ වන තෙක් ඒ අභියෝගය භාරගන්න පොලීසිය ඉදිරියට ආවේ නැහැ.

ඇත්තෙන්ම, පොලීසිය මේවා ප්‍රසිද්ධ නොකරන්නේ, සීසීටීවී දශර්න ප්‍රසිද්ධ කළොත් කාකි සූට් ඇඳගත්ත මැරයන්ගේ ඇඳුම් ගැලවෙන බව, කාකි සූට් පිත්තල බොත්තම් ගැලවෙන බව ඒ අය හොඳටම දන්න නිසා.

ඇත්තෙන්ම දැන් සුරේෂ් සලේ මැතිතුමා කියනවානේ මට වදහිංසා කළේ කැමරා අටක් තිබෙන ස්ථානයක කියලා. සාමාන්‍යයෙන් අපි දන්නවා, පොලීසිය වදහිංසා කරන්නේ කැමරා නැති තැනක. අපරාධකරුවෙක් වුණත් සීසීටීවී කැමරා මඟහරිමින් තමයි ඒ අපරාධය සිද්ධ කරන්නේ. ඇයි දැන් පොලීසිය කැමරා ඉදිරියේ

වදහිංසා කළාම, අනාගතයේ යම් දවසක තමන්ට එරෙහිව මේක සාක්ෂියක් විදිහට භාවිත කළ හැකියි කියන කාරණය පොලීසියේ මහත්තුරු, විශේෂයෙන්ම පහරදීමට දිගුකාලීන පළපුරුද්දක් ඇති රහස් පොලීසියේ මහත්තුරු හොඳටම දන්නවා. එහෙමනම්, එවැනි අවදානමක් අරගෙන රහස් පොලීසියේ මහත්තුරු සීසීටීවී කැමරා අටක් ඉදිරියේ මේ වදහිංසා ලබාදීම සිදු කළේ ඇයිද කියන සාධාරණ ප්‍රශ්නය මතු වෙනවා.

අපි හිතන්නේ, මේක යටි අරමුණකින් කරපු වැඩක්. අපි හොඳටම දන්නවා, සුරේෂ් සලේ මැතිතුමා කියන්නේ කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමට තීරණාත්මක කාර්යභාරයක් කළ, ඒ වගේම මහාචාර්ය රොහාන් ගුණරත්න මැතිතුමාගේ වචන වලින් කියනවා නම් ලෝකයේ කලාතුරකින් බිහිවෙන දුලර්භ ජාතික වීරයෙක්. ඔහු කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමට කළ තීරණාත්මක දායකත්වය නිසා කොටි හිතවාදීන් ඔහු සමග ඉන්නේ දැඩි වෛරයකින්. ඒ නිසාම, අසාමාන්‍ය ලෙස සීසීටීවී කැමරා අටක් ඉදිරියේ ඔහුට වදහිංසා කළේ පොලීසිය, ඒ සීසීටීවී දර්ශන කොටි හිතවාදීන්ට අලෙවි කිරීමේ යටි අරමුණින්ද කියන සාධාරණ සැකය අපිට මතු වෙනවා. ඒ නිසා තමයි මෙවැනි අවදානමක් පොලීසිය අනිවාර්යයෙන්ම අරගෙන තිබෙන්නේ.

ඒ වගේමයි, ජනාධිපතිවරණයේදී බෙදුම්වාදීන්ගේ ඡන්ද කුට්ටිය හිමිවුණේ මාලිමාවට. බොහෝවිට සල්ලි කුට්ටියකුත් හිමිවෙන්න ඇති අපිට නොකිව්වට. ඒ නිසා අපි මේ මාලිමා ආණ්ඩුවට දිගින් දිගටම බලපෑම් කළා බෙදුම්වාදීන්ට ඔබ ලබාදුන් පොරොන්දු හෙළිදරව් කරන්න කියලා. වසර දෙකකට ආසන්න කාලයක් තිස්සේ අපි ඔවුන්ට බලපෑම් කළත්, අද දක්වා බෙදුම්වාදීන් සහ ඔවුන් අතර ඇතිවෙච්ච රහස් එකඟතාවය හෙළිදරව් කරන්න මාලිමා ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා, සුරේෂ් සලේ මැතිතුමාට වෙනත් කිසිම රැඳවියකුට නොකරන ආකාරයේ බරපතළ වදහිංසා කරන්නේ, තමන්ට ඡන්දය දුන්නු, සල්ලි දුන්නු, කොටි හිතවාදීන්ට, බෙදුම්වාදී බලවේගයන්ට කළගුණ සලකන්නද කියන ප්‍රශ්නය අපි මාලිමාවෙන් අහනවා.

ඒ වගේම, බොහෝ වෙලාවට ඒක ඡන්ද පොරොන්දු ඉටුකිරීමක් වෙන්නත් පුළුවන්. සුරේෂ් සලේ මැතිතුමාට වදහිංසා කරනවාය කියන කාරණය අපි රටට හෙළිදරව් කළාම, පොලීසිය හැරෙන තැපෑලෙන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා, අපි කියන්නේ බොරුයි කියලා රටට කිව්වා. දැන් මේ වන විට, පොලීසිය කියන්නේ බොරුව, අපි කිව්වේ ඇත්තක්ය කියන කාරණය අධිකරණ වෛද්‍ය වාතර්‍ා වලිනුත්, මානව හිමිකම් කොමිසමේ විමශර්න වලිනුත් තහවුරු වෙලා හමාරයි.

ඒ නිසා, වහාම පොලිස් මාධ්‍ය කොට්ඨාසය නිවේදනයක් නිකුත් කරලා, අපි ගැන බොරු ප්‍රචාරය කරමින් අපහාස කිරීම පිළිබඳ සමාව ගත යුතුයි. සතියක් ඇතුළත පොලීසිය සමාව ගැනීමට අපොහොසත් වුණොත්, රුපියල් බිලියනයක් වන්දි ඉල්ලා නඩු දාන්න අපි කටයුතු කරනවා.

ඒ වගේම, "අපි කියන්නේ බොරුයි" කියන එක ප්‍රධාන පුවතක් කරගත්ත මාධ්‍ය ආයතන වලටත්, සමාජ මාධ්‍යවේදීන්ගෙනුත් අපි ඉල්ලීමක් කරනවා, අද අපි මේ ප්‍රවෘත්ති සාකච්ඡාවේ කියන කාරණයට එදා පොලීසියේ බොරු ප්‍රචාරයට ලබාදුන්න ප්‍රචාරය හා සමාන අයුරින් ප්‍රචාරයක් ලබා නොදුන්නොත්, ඔබටත් එරෙහිව නඩු පැවරීමට සිදුවන බව ඉතාම කනගාටුවෙන් සිහිපත් කරනවා.

සලේගේ මුරපදය ඉල්ලා බල කරන්න කාටවත් අයිතියක් නෑ

ඒ වගේම සුරේෂ් සලේ මැතිතුමා තමන්ගේ ජංගම දුරකථනයේත්, පරිගණකයේත් මුරපදය ලබා දෙන්නේ නැහැයි කියලා රහස් පොලීසියේ නිලධාරීන් නහයෙන් අඬනවා. ඒ අය නම් බැරුවෑ, ආණ්ඩුවේ, මාලිමාවේ ආණ්ඩුවේ සිටින දේශපාලකයොත්, මාලිමා ආණ්ඩුවට කඩේ යන විපක්ෂයේ සිටින දේශපාලකයොත් මේ මුරපදය ලබා දිය යුතුයි කියලා නහයෙන් අඬනවා අපි දකිනවා. රටේ නීතිය ගැන අවබෝධයක් තිබෙන අයට නම් මේ ප්‍රකාශ තවත් එක් විහිළුවක් විතරමයි, මාලිමාවේ රංගනයක් පමණමයි.

ඇයි අපි එහෙම කියන්නේ? සලේ මැතිතුමා මේ වන විට පොලිස් විමශර්නයක සැකකරුවෙක්. ලංකාවේ විතරක් නෙවෙයි, සමස්ත ලෝකයේම පවතින නීතිමය මූලධමර්යට අනුව කිසිම සැකකරුවෙක් තමන්ට එරෙහිව කරන විමශර්නයකට සහය දීමට බැඳිලා නැහැ. තමන්ට එරෙහිව විමශර්නයට සහය දීමට කිසිම සැකකරුවෙක් බැඳී නැති බව සමස්ත ලෝකය පුරාම පිළිගත්ත නීතිමය මූලධමර්යක්.

ඒ වගේම, යම් සැකකරුවෙකු තමන්ට එරෙහිව පවතින විමශර්නයට සහය දෙන්නේ නැත්නම්, ඔහුගේ සහය බලහත්කාරයෙන්, බලපෑම් කිරීමෙන් ලබාගන්න බැහැයි කියන එකත් ඉතා පැහැදිලිව ලෝකය පුරාම පිළිගත් නීතිමය මූලධමර්යක්. මෙන්න මේ කාරණා දෙකම අපේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් වෙනවා. මොකක්ද කාරණය? එකක්, යම් විමශර්නයක සැකකරුවෙකු තමන්ට එරෙහිව පවතින විමශර්නයට සහය නොදී සිටීමට අයිතියක් ඇත. යම් සැකකරුවෙක් ඒ විමශර්නයට සහය නොදී සිටිනවා නම්, ඔහුට සහය දෙන මෙන් බල කරන්න, බලපෑම් කරන්න කිසිවෙකුට අයිතියක් නැත. අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් වෙන, ඒ වගේම ලෝකය පුරාම පිළිගත්ත විශ්වීය නීතිමය මූලධමර්යක් ඒක.

එතකොට මේ රහස් පොලීසියේ නිලධාරීනුත්, ඒ වගේම ආණ්ඩුවේත්, විපක්ෂයේ සමහර දේශපාලකයෙකුත් සලේ මහතා විසින් මේ මුරපදය පොලීසියට ලබාදිය යුතු යැයි බලපෑම් කිරීම අපරාධ නඩු විධාන සංග්‍රහය අමු අමුවේ උල්ලංඝනය කිරීමක්. එහෙම තමන්ට එරෙහිව කරන විමශර්නයකට සහය දෙන්නැයි කියලා බලපෑම් කරන්න මේ සලේ මැතිතුමාට විතරක් නෙවෙයි, ඕනෑම දරුණු ගණයේ අපරාධකරුවෙකුටවත් එවැනි බලපෑම් කරන්න කාටවත්ම අයිතියක් නැහැ.

වෙනත් රටවල් වල නම් යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්නකොට, එක; අත්අඩංගුවට ගන්න හේතුව කියනවා. දෙක; අත්අඩංගුවට ගත්තාය කියලා පවුලේ අයට ලදුපතක් නැත්නම් රිසිට් (receipt) එකක් නිකුත් කරනවා. තුන; ඒ සැකකරුවාට පැහැදිලි කරනවා, ඔබට මේ විමශර්නයට සහය නොදී නිහඬව සිටීමේ අයිතියක් තිබේ කියලා පැහැදිලි කිරීමක් කරනවා. ඒ විතරක් නෙවෙයි, ඔබට නීතිඥ සහයක් ලබා ගැනීමට අයිතියක් ඇත කියලා පැහැදිලි කරනවා. මෙන්න මේ කාරණා හතරම අනිත් රටවල් වල වගේම අපේ රටේත් නීති පොතේ තියෙනවා, හැබැයි ඉතින් පොලීසිය අත්අඩංගුවට ගද්දි ඕවා නම් කියන්නේ නැහැ, "වර" කියලා කොලරයෙන් අල්ලලා අරගෙන පස්සට පයින් එකක් ගහලා තමයි ජීප් එකට දාගන්නේ.

එතකොට අපි මේවා සම්බන්ධයෙන් නඩු ගණනාවක් කතා කරලා තියෙනවා. උදාහරණයක් විදිහට, සුරේෂ් සලේ මැතිතුමා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීවත්, පිල්ලෙයාන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීවත්, අත්අඩංගුවට ගැනීමට හේතු කිව්වෙත් නැහැ, ලදුපත නිකුත් කළෙත් නැහැ, ඒ වගේම නිහඬව සිටීමේ අයිතිය හෝ නීතිඥ සහය ගැනීමේ අයිතිය පිළිබඳ පැහැදිලි කිරීමක් කළෙත් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන වගන්තිය අමු අමුවේ උල්ලංඝනය කරමින් තමයි මේ අයව අත්අඩංගුවට අරන් තියෙන්නේ. ඒ පිළිබඳ දැනටමත් අධිකරණය ඉදිරියේ නඩු පවරලයි තිබෙන්නේ.

සලේ මැතිතුමාට තමන්ගේ නිදෙර්ෂී භාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය කරන සාක්ෂි තිබෙන්නේ ඔහුගේ ජංගම දුරකථනයේ සහ පරිගණකයේ සුරක්ෂිත කරලා අරන් තියලා තියෙනවා වෙන්න පුළුවන්. ඔය ඒ සාක්ෂි රැකගන්නවාය කියන්නේ ඔහුගේ ජීවිතය රැකගන්නවා කියන එකයි. ඔහුව මහ මොළකරු කිරීමට ආණ්ඩුව දරන කුමන්ත්‍රණය පරාජය කළ හැක්කේ මේක තුළ තිබෙන සාක්ෂි වලින් විතරක් නම්, ඒවා සුරක්ෂිත කරගැනීම ඔහුගේ ජීවිතය රැකගැනීම හා සමාන අයිතියක්.

කොටින්ගේ පදයට නටන රහස් පොලීසිය, මම ඉතාම වගකීමෙන් කියනවා රහස් පොලීසිය සියල්ල කෙසේ වෙතත්, රහස් පොලීසියේ අධ්‍යක්ෂකවරයා අධ්‍යක්ෂක ධූරයට පත්වුණු දවසේ සිට, තවත් ඈතට ගියොත් රහස් පොලීසියේ සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස කටයුතු කරන සමයේ සිටම ඔහු කටයුතු කර ඇත්තේ කොටි හිතවාදියෙකු ලෙසයි. ඒ පිළිබඳ නිශ්චිත සාක්ෂි මා පාස්කු ප්‍රහාරය පිළිබඳ ලියපු පොතේ නඩු අංක සහිතව, විමශර්න ගොනු අංක සහිතව සඳහන් කරලා තිබෙනවා.

එතකොට මේ වගේ කොටි හිතවාදී රහස් පොලීසියේ ලොක්කෙක් ඉදිරියේ තමන්ගේ මුරපදය ලබාදීලා ඒ තිබෙන සාක්ෂි රහස් පොලීසිය විසින් විනාශ කළොත්, ඔහුට තමන්ගේ නිදෙර්ෂී භාවය ඔප්පු කිරීමට තිබෙන අවස්ථාව සදහටම අහිමි වීමේ අවදානමක් තිබෙනවා. ඒ නිසයි ඔහු තමන්ගේ මුරපදය, එක පැත්තකින් නීත්‍යානුකූලව ඔහුට බැඳියාවක් නැහැ මුරපදය ලබාදෙන්න, රහස් පොලීසියට අයිතියක් නැහැ මුරපදය ඉල්ලලා බල කරන්න. ඊළඟට, ඔහුගේ නිදෙර්ෂීභාවය ඔප්පු කිරීමේ සාක්ෂි තියෙන්නේ පරිගණකය තුළ, ජංගම දුරකථනය තුළ සුරක්ෂිත කරලා නම්, ඒක දිව්හිමියෙන් රැකගැනීමේ අයිතියක් ඔහුට තියෙනවා.

ඒ වගේමයි, මන් දැක්කා සමහර විපක්ෂයේ දේශපාලකයන් ගණනාවක් සඳහන් කරනවා ඔහුගේ දුරකථනයේ සමහර වෙලාවට සංවේදී බුද්ධි තොරතුරු තියෙන්න පුළුවන්, ඒවා හෙළිදරව් වෙන එක වළක්වන්න ඔහු මුරපදය ලබා නොදිය යුතුයි කියලා. එතකොට මන් දැක්කා සිරිල් ගාමිණී පියතුමා මාධ්‍ය හමුවක් තියලා කියනවා, "එහෙම කොහොමද එහෙම තියෙන්නේ? ඔහු ගාව බුද්ධි තොරතුරු තිබුණා නම්, විශ්‍රාම ගද්දි ඒ සියල්ල හමුදාවට භාර දිය යුතුව තිබුණා" කියලා. ඒ සිරිල් ගාමිණී පියතුමා බුද්ධි ක්‍රියාකාරකම් ගැන දන්න පමණ තමයි. ඔන්න ඔබ තමයි පියතුමනි, දන්නා බව ප්‍රදශර්නය කරන්න ගිහිල්ලා නොදන්නාකම ප්‍රදශර්නය කරනවා කියන්නේ ඔන්න ඔය වගේ අවස්ථා වලටයි. ඇයි අපි එහෙම කියන්නේ? එතුමා බුද්ධි ක්‍රියාකාරකම් පිළිබඳ මෙලෝ හසරක් දන්නේ නැතිවෙන්න පුළුවන්. කොහෙද බුද්ධි ක්‍රියාකාරකම් ගැන ඉගෙන ගන්නේ, අඩුම ගානේ තාම බයිබලයවත් හරියට කියවලා නැහැ. මොකද අපි කලින් මාධ්‍ය හමුවේදී පෙන්නුවා එතුමාට බයිබලය ගැන කිසිම අදහසක් නැහැයි කියලා. ඔව් ඉතින්, එතුමාට අර එන්ජීඕ (NGO) වල වැඩ තියෙනවනේ, හරි කාර්‍යබහුලයිනේ. ඉතින් බයිබලය කියවන්නත් එතුමාට වෙලාවක් නැහැ.

ඇත්තෙන්ම බුද්ධි අංශ මිනිසුන් යොදාගෙන තොරතුරු රැස්කිරීමේ ක්‍රම දෙකක් තියෙනවා. එකක්; බුද්ධි නිලධාරියෙක් තොරතුරු ගැනීමට අවශ්‍ය සංවිධානය තුළට රිංගා ගැනීම. අනිත් එක; ඒ සංවිධානය ඇතුලේ ඉන්න කෙනෙක්ව තොරතුරු දෙන ආකාරයට දිනා ගැනීම. ඔය සංවිධානයක් ඇතුලේ කෙනෙක් අභ්‍යන්තර තොරතුරු බුද්ධි අංශ වලට දෙනවා කියන්නේ තමන්ගේ ජීවිතය පරදුවට තබලා කරන වැඩක්. අපිට මතකයි, කොටි සංවිධානයේ දෙවැනියා වෙච්ච මහත්තයාව වේලුපිල්ලේ ප්‍රභාකරන් මරා දාන්නේ ඉන්දියානු බුද්ධි අංශ වලට කොටි සංවිධානයේ රහස් තොරතුරු ලබාදෙනවා කියන චෝදනාව එල්ල කරමින්. කෙලින්ම මරණය හිමිවන කාරණයක්.

ඒ නිසා, තමන්ට ඒ තොරතුරු ලබාදෙන්නේ තමන්ගේ විශ්වාසය සීයයට සීයයක් දිනාගත්ත නිලධාරියෙකුට විතරයි. නිලධාරියා විශ්‍රාම යද්දි, මාරු වෙද්දි, ඒ අය යෝජනා කරනවා "මම දැන් යනවා, මම වෙනුවට අහවල් නිලධාරියා එනවා, ඒ නිලධාරියාට ඔබ ඉදිරියට තොරතුරු ලබාදෙන්න" කියලා. එතකොට අර පුද්ගලයා කැමති වෙන්නත් පුළුවන්, අකමැති වෙන්නත් පුළුවන්, "අනේ නැහැ සර්, සර් නැත්නම් මට අනිත් එවුන් විශ්වාසයක් නැහැ, මගේ අත්දැකීම් එක්ක මම එහෙනම් මේ තොරතුරු දෙන වැඩේ නතර කරනවා.

ඒ තොරතුරු, බුද්ධි නිලධාරීන් තමන්ගේ තොරතුරුකරුවන් පිළිබඳ රහසිගත තොරතුරු ඉහළට වාතර්‍ා කරන්නේ නැහැ. තොරතුරුකරුවන්ගෙන් ලබාගත්ත බුද්ධි තොරතුරු ඉහළට වාතර්‍ා කළත්, ඒ තොරතුරු රැස්කරන නිලධාරියා ගාව විතරයි තොරතුරු දෙන පුද්ගලයා පිළිබඳ රහස් තොරතුරු තියෙන්නේ. ඒවා ප්‍රසිද්ධියේ දත්ත බැංකු වල දාලා තිබ්බොත් එහෙම, අන්තිමට සිද්ධ වෙන්නේ එක පාවාදෙන්නෙක් හිටියොත් ඔවුන්ගේ ජීවිතයම අනතුරට පත්වෙන නිසා.

එතකොට සුරේෂ් සලේ මැතිතුමා වසර 38 ක් පුරාවට බුද්ධි ක්ෂේත්‍රයේ හිටපු නිලධාරියෙක්. ඔහු තොරතුරු ලබාගන්නා නිලධාරියෙක් විදිහට, ක්ෂේත්‍ර නිලධාරියෙක් විදිහට කටයුතු කරන කාලයේ ඉඳන් ගොඩනගා ගත්ත බුද්ධි තොරතුරු ජාලයක් තියෙනවා. මේ අතර ඉන්න පුළුවන් තොරතුරුකරුවන්, "ඔබට හැර වෙන කාටවත් මම තොරතුරු දෙන්නේ නැහැ" කිව්ව ස්ථාවරයට ගියා. ඒක බුද්ධි ලෝකයේ සාමාන්‍ය තත්ත්වයක්. සමහර වෙලාවට පෙම් සබඳතා ඇති කරගන්නවා තොරතුරු ගන්න. සමහරු ගිහිල්ලා කසාද

බඳිනවා අර සතුරු පිලේ තොරතුරු ගන්න. එවැනි කෙනෙක් තමන්ගේ සැමියා පිළිබඳ ලබාදෙන තොරතුරු කිසිසේත්ම විශ්වාසනීය නොවන කෙනෙකුට දෙන්නේ නැහැ. එවැනි තොරතුරුකරුවන්ගේ ගැන තොරතුරු ඔහු විශ්‍රාම යද්දි තමන් ගාව තියාගන්නවා මිසක්, ඒවා හමුදාවට හෝ තමන්ගේ බුද්ධි ආයතනයට භාර දෙන්නේ නැහැ. මේ පිළිබඳ ලෝකයේ පොත් ගණනාවක් ලියවිලා තියෙනවා. මේවට අපි කියනවා හියුමින්ට් (HUMINT) කියලා, මිනිසුන් යොදාගෙන බුද්ධි තොරතුරු රැස්කිරීම. ඉතින් ඒ ගැන පොත් තියෙනවා, චිත්‍රපටි තියෙනවා, වාතර්ාමය වැඩසටහන් තියෙනවා. හැබැයි අපේ සිරිල් ගාමිණී පියතුමාට ඕවා කියවන්න වෙලාවක් තියෙයිද දන්නේ නැහැ.

දැන් විශේෂයෙන්ම අපි දන්නවා, සුරේෂ් සලේ මැතිතුමා තමයි කරුණා අම්මාන් කොටි සංවිධානයෙන් බිඳී හමුදාවට එකතු වීම සම්බන්ධීකරණය කරපු නිලධාරියා. ඒ නිසා ඒක සිදුවුණු ආකාරය පිළිබඳ සංවේදී තොරතුරු, ඔහුට ඒ පිළිබඳ තොරතුරු ගෙනාපු පුද්ගලයන් පිළිබඳ දැනගැනීමේ උවමනාව වැඩියෙන්ම තියෙන්නේ වෙන කාටවත් නෙවෙයි, කොටි සංවිධානයට.

රහස් පොලීසිය හමුදා බුද්ධි අංශ තොරතුරු හෙළිදරව් කරගැනීමේ වන්දිය අපි ඉතිහාසයේ ගෙවලා තියෙනවා. අපි දන්නවා පොලීසිය ගිහිල්ලා මිලේනියම් සිටි (Millennium City) වල තිබුණු සුරක්ෂිත නිවසක් වටකිරීමේ ප්‍රතිඵලය, නැත්නම් මිලේනියම් සිටි පාවාදීම ලෙස 2002 වසරේ අපේ ඉතිහාසයේ සිදුවෙච්ච කළු පැල්ලම අපි හැමෝම දන්නවා. ඒ තොරතුරු පොලීසියට නිරාවරණය වීමේ ප්‍රතිඵලයක් විදිහට, ශ්‍රී ලංකාව බිහිකළ, ඔය සලේ මැතිතුමා වගේම ශ්‍රී ලංකාව බිහිකළ විශිෂ්ටතම බුද්ධි නිලධාරියෙක් වෙන තුවාන් මුතාලිෆ් මැතිතුමාගේ ජීවිතය ඇතුළු විශිෂ්ට රණවිරුවන් ගණනාවක් සහ බුද්ධි තොරතුරු ලබාදෙන්නන් 73 කුගේ ජීවිත අහිමි වුණා මිලේනියම් සිටි පාවාදීම හරහා හමුදා බුද්ධි තොරතුරු පොලීසියට නිරාවරණය වීමෙන්.

එයින් ඇතිවෙච්ච දැවැන්ත කලකිරීම මත ශ්‍රී ලංකාව බිහිකළ විශිෂ්ටතම බුද්ධි නිලධාරියෙක් වෙන හමීඩ් නිලාම් රණවිරුවා ශ්‍රී ලංකාව හැරදා යනවා. අද වනතුරු, දැන් මේක 2002 දී වෙන්නේ, මං හිතන්නේ 2004 දී විතර ඔහු රට අත්හැර ගියේ, මට වසර හරියටම මතක නැහැ, අද වනතුරු ඔහු ශ්‍රී ලංකාවට ඇතුළත් වෙලා නැහැ. ඔහු රහසිගතව විදේශ රටක ජීවත් වෙනවා.

මම එදා 2002 දී මිලේනියම් සිටි පාවාදීම රටට හෙළිදරව් කළේ මමයි, සිහළ උරුමයේ ප්‍රචාරක ලේකම්වරයා විදිහට. ඒ නිසා එදා ඒ බුද්ධි නිලධාරීන් වසර තිස් ගණනක් පුරාවට අපෙත් එක්ක ඒ සම්බන්ධය පවත්වගෙන එනවා. ඔහු අද වනතුරු ශ්‍රී ලංකාවට ඇතුළත් වෙන්නේ නැහැ එදා ඇතිවෙච්ච කලකිරීමට. මිලේනියම් සිටි පාවාදීමේ කතන්දරයේ අභ්‍යන්තරයේ සිට දන්න පුද්ගලයන් විදිහට අපිට නම් ශානි අබේසේකර මහත්තයාටයි, සිරිල් ගාමිණී පියතුමාටයි මේ මුරපදය එළියට ගැනීමට තිබෙන උවමනාව තේරුම් ගන්න හොඳට පුළුවන්.

සලේ මැතිතුමාට කරන වදහිංසාවන් සාධාරණීකරණය කරමින් නිරන්තරයෙන් මාධ්‍ය හමුව පවත්වන සිරිල් ගාමිණී පියතුමා ඊයේ දිනයෙත් මාධ්‍ය හමුවක් පවත්වලා තවත් පව වැලක් රට ඉදිරියේ තැබුවා. එතුමාගේ පව වලට උත්තර දීම අපේ වගකීමක්.

ඇත්තෙන්ම මීට කලින් මේ වගේම පව වැලක් කිව්වම මම එතුමාට කාරණා දෙකක් සඳහන් කළා. මම එතුමාගෙන් ඉල්ලීමක් කළා, මුළු බයිබලයම කියවන්න තරම් එතුමාට වෙලාවක් නැතිනම්, අඩුම ගානේ පරණ තෙස්තමේන්තුවේ එන දස පනත කියවන්න. දෙවියන් වහන්සේ කතෝලික බැතිමතුන්ට දුන්න නියමයන් දහය. ඒ නියමයන් දහයේ අටවෙනි නියමය තමයි, "බොරු නොකියනු" කියන එක. එතුමා ඊයෙත් පව වැලක් දෙසා බැමෙන් පේන්නේ, එතුමාට තවම දස පනත කියවන්න තරම්වත් වෙලාවක් ලැබිලා නැති බවයි. ඒ වගේම මම එතුමාට සිහිපත් කළා, දෙවියන් වහන්සේ ඔබතුමාට කන් දෙකක්, ඇස් දෙකක්

සහ එක කටක් දීලා තියෙන්නේ, හොඳින් කියවලා, හොඳින් ඇහුම්කන් දීලා ඊට පස්සේ කතා කරන්න. නමුත් අවාසනාවට, එතුමා දෙවියන් වහන්සේවත් විශ්වාස නොකරන බවත් තමයි ඊයේ මාධ්‍ය හමුවෙන් පෙන්නුම් කරේ.

එතුමා ඊයේ කිව්වා, ශානි අබේසේකර මහත්තයාව රහස් පොලීසියේ අධ්‍යක්ෂක විදිහට පත් කරන්න කියලා අපි නම් කරලා ඉල්ලීමක් කළේ නැහැ. එහෙම කියලා එතුමා කියනවා, ශානි අබේසේකර මැතිතුමා ඇතුළු පිරිස රහස් පොලීසියේ අධ්‍යක්ෂකවරයා විදිහට පාස්කු ප්‍රහාරය පිළිබඳ හොඳින් විමශර්න කරගෙන ආවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණාම ඒ පිරිස වහාම ඉවත් කළා, අපි ඉල්ලුවේ කලින් විමශර්නය කරගෙන ගිය පිරිසට නැවත පාස්කු විමශර්නය භාර දෙන්න කියන ඉල්ලීම පමණයි. අපි ඔය කතාව ඇත්තයි කියලා හිතමු. දැන් මොකක්ද මේ කියන්නේ? එක, එතුමා දැනන් ඉඳලා තියෙනවා ශානි අබේසේකර මහත්තයා තමයි මේ පාස්කු විමශර්නයට නායකත්වය දෙන්නේ. එතුමාව ඇතුළු පිරිසක් ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඇවිල්ලා ඉවත් කරනවා. මෙතුමන්ලා ඉල්ලීමක් කරේ අර පරණ කට්ටිය, පරණ කට්ටියට නැවත දෙන්න කියලා. හැබැයි එතුමා හොඳටම දන්නවා පරණ කට්ටියේ නායකයා ශානි අබේසේකර කියලා. එහෙනම් ශානි අබේසේකර යළි පත් කරන්න කියන එක නෙවෙයිද මේ කියලා තියෙන්නේ? දැන් එතුමා කියන්නේ සෘජුව ඉල්ලුවේ නැහැ, අපි ඉල්ලුවේ මෙහෙමයි. එහෙම වුණත් අර බිමල් රත්නායක ඇමතිතුමා කිව්ව කතාව ඇත්තනේ. පියතුමනි, පද වැල් මාරු කරලා ඇත්ත නැත්ත කරන්න බැහැ. ඔන්න ඕකට තමයි කියන්නේ "කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ" කියලා.

ඒ වගේම පාස්කු ප්‍රහාරය පිළිබඳ වතර්මාන විමශර්නයට පාදක වුණු කුමන්ත්‍රණ න්‍යාය පැහැදිලි කරන්න සුනන්ද දේශප්‍රිය මහතා විසින් පොතක් ලියනවා. ඔය පොත් නිකුත් වූ උළෙලේ ප්‍රධාන දේශකයෝ දෙන්නා තමයි, අද පැමිණිලිකරුගේ භූමිකාව රඟපාන සිරිල් ගාමිණී පියතුමාත්, එතුමන්ලාගේ ඉල්ලීම මත ප්‍රධාන විමශර්කයාගේ භූමිකාව රඟපාන ශානි අබේසේකර මහත්තයාත්. ඉතින් දෙන්නා හම්බවුණේ එකම තැන එතන නෙවෙයි, එතන දෙන්නා හොඳට කතා බහ කරමින් හිටියා. හැබැයි ඊට කලින්, සමාජය සහ සාමයික කේන්ද්‍රයේදී හමුවෙලා මේ දෙන්නා මේ කුමන්ත්‍රණ න්‍යාය සමාජගත කරන්නේ කෙසේද කියන එක ගැන සාකච්ඡා පැවැත්වූ බව අපි මීට කලින් හෙළිදරව් කරලා තියෙනවා. දැන් නම් ඒවට සාක්ෂි විදිහට, ඒ කුමන්ත්‍රණයට සම්බන්ධ වෙච්ච විපක්ෂයේ මන්ත්‍රීවරු අද මාධ්‍ය හමුව පවත්වලා කියනවා "මෙහෙම කුමන්ත්‍රණයකට අපිත් අහුවෙලා හිටියා"ය කියලා.

එතකොට දැන් මොනවා වුණත්, ඒ නිසා එදා ඒ කුමන්ත්‍රණයේ හිටපු අය දැන් මේ කුමන්ත්‍රණය හෙළිදරව් කරලා ඉවරයි කියන එක අපි සිරිල් ගාමිණී පියතුමාට සිහිපත් කරනවා. ඇත්තෙන්ම මොනවා වුණත් බිමල් රත්නායක ඇමතිතුමාට කොන්දක් තියෙනවා, ඒ නිසා තමයි සිරිල් ගාමිණී පියතුමා කෙතරම් ප්‍රතික්ෂේප කළත්, තමන් කරපු ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නවත්, නිවැරදි කරන්නවත් බිමල් රත්නායක ඇමතිතුමා පෙළඹුණේ නැත්තේ. මොකද එතුමා දන්නවා "මම කිව්වේ ඇත්ත, එයා බොරු කිව්වට මට බොරුකාරයෙක් වෙන්න බැහැ, දස පනත එතුමා උල්ලංඝනය කරත් හතරවෙනි සිල් පදය මම රැකගන්න ඕනේ" වගේ අදහසක බිමල් රත්නායක ඇමතිතුමා ඇති.

එතකොට අපි දිගින් දිගටම කියපු කාරණයක් තමයි ශානි අබේසේකර මහත්තයාව රහස් පොලීසියේ අධ්‍යක්ෂක ධූරයෙන් ඉවත් කරන්න ගෝඨාභය ආණ්ඩුව කටයුතු කළේ ඇයි කියන එක. ඕනෑම විමශර්නයකදී මූලික ප්‍රතිපත්තිය තමයි චෝදනාවට ලක්වෙච්ච අයව ඒ ආයතනයෙන් ඉවත් කරන්න ඕනේ විමශර්නය කරන්න කලින්. මොකද චූදිතයා, සැකකරුවා නම් විමශර්නයත් කරන්නේ, ඒ විමශර්නය පිළිබඳ කිසිම විශ්වාසයක් ඇතිවෙන්නේ නැහැ. සාමාන්‍ය රජයේ ක්‍රමය තමයි විමශර්නයක් කරද්දී සැකකරුවෙක් ඉන්නවා නම් එක්කෝ එයාව වෙන තැනකට මාරු කරනවා. එහෙම නැත්නම් අනිවාර්යෙන් නිවාඩු යවනවා, එහෙමත් නැත්නම් වැඩ තහනම් කරනවා. ශානි අබේසේකර මහත්තයාව වෙනත් තැනකට මාරු කළේ, ඔහු රහස් පොලීසියේ අධ්‍යක්ෂක වෙලා ඉන්න තාක් පාස්කු විමශර්නය නිසියාකාරව සිදුකරන්න බැහැ. මොකද පාස්කු ප්‍රහාරයට සෘජුවම දායක වුණු බවට ඔහුට එරෙහිව චෝදනා

12 ක් හෙළිදරව් වෙලා තියෙනවා. ඇත්තටම මේ චෝදනා මතු වුණේ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ. ඊට පස්සේ ඔහුට එතන ඉන්න කිසිසේත්ම හැකියාවක් නැහැ. ඊට කලිනුත් මේ චෝදනා ගැන සමාජයේ කතාබහක් තිබුණා. එතකොට, විශේෂයෙන්ම ශානි අබේසේකර මහත්තයාට ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ චෝදනා නැගුවා විතරක් නෙවෙයි, මේ චෝදනා පිළිබඳ විමශර්නය කරපු විශ්‍රාමික විනිසුරු ඒ.එන්.ජේ. අල්විස් කමිටුව විසින් ඔහුට පාස්කු ප්‍රහාරයට දායක වීම සම්බන්ධයෙන් අපරාධ නඩු ගොනු කිරීමට නිදෙර්ශ කරලා තියෙනවා. එතකොට මේ සිරිල් ගාමිණී පියතුමන්ලා පාස්කු විමශර්නය භාරදෙන්න කියලා ඉල්ලලා තියෙන්නේ, පාස්කු ප්‍රහාරයට දායකත්වය දැක්වූවාය කියලා චෝදනා 12 ක් එල්ල වුණු, ජනාධිපති විමශර්න කමිටුවකින් අපරාධ නඩු ගොනු කරන්න නිදෙර්ශ කරපු රහස් පොලීසිය විසින් විමශර්නයක් සිදුකරන කෙනෙක්.

දැන් ඇත්තටම මොකද වුණේ? සිරිල් ගාමිණී පියතුමාගේ ඉල්ලීම පරිදි, සිරිල් ගාමිණී පියතුමන්ලාගේ ඉල්ලීම පරිදි සමස්ත පොලීසියේ ලොක්කා විදිහට පත්කළා රවී සෙනෙවිරත්න මහත්තයාව, රහස් පොලීසියේ ලොක්කා විදිහට පත්කළා ශානි අබේසේකර මහත්තයාව. මොකක්ද මේකේ ප්‍රතිඵලය? මේ වන විට ඔවුන් දෙදෙනාගේ පාස්කු ප්‍රහාරයට දායකත්වය පිළිබඳ රහස් පොලීසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දුක ද සිල්වා විසින් විමශර්නයක් සිදුකරමින් හිටියා. ඒක කොටුව මහේස්ත්‍රාත් උසාවියේ තිබ්බ නඩු අංක B 340/97/ 24.

දැන් මොකක්ද වෙන්න යන්නේ? හොරාගේ අම්මාගෙන් පේන අහනවා වෙනුවට, හොරාටම භාර දීලා පේන අහන වැඩේ. මොකද වුණේ? මේ විමශර්නය සම්පූණර්යෙන් කඩාකප්පල් කරා. මේ අය පත්වෙලා මාසයක් යන්න කලින් ඉන්දුක ද සිල්වා මේ විමශර්නයෙන් ඉවත් කරලා, රහස් පොලීසියෙනුත් ඉවත් කරලා, පොලිස් මූලස්ථානයට මාරු කරනවා. දැන් මොකද වෙන්නේ? පොලිස් විමශර්නය සම්පූණර්යෙන් කොට උඩ යනවා.

දැන් මේ මං ගාව තියෙනවා ලිපියක්, මේක 2026 මාතර්ු 26. රහස් පොලීසියේ අධ්‍යක්ෂකට, අතිරේක සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා අත්සන් කර යවන ලද ලිපියක්. අපි දන්නවා, ශානි අබේසේකර මහත්තයා ලියන සුරංගනා කතා උසාවියට ඇවිත් කියන්නේ දිලීප පීරිස් මහත්තයා. දැන් ඉස්සර සිබිල් වෙත්ත සිංහ නැන්දා ලියන සුරංගනා කතා අපිට පුංචි කාලේ කිව්වේ අපේ ආච්චි. හැබැයි, ඒ ආච්චිගේ කායර්භාරය ඉටුකරන්නේ දිලීප පීරිස් මහත්තයා. දිලීප පීරිස් මහත්තයා මොකක්ද කියන්නේ?

2019 අප්‍රේල් 9 වන දින පාස්කු ප්‍රහාරයට සම්බන්ධව ලැබී ඇති තොරතුරු නිසි පරිදි විමශර්නය නොකිරීමෙන් පාස්කු ප්‍රහාරය සිදුවීම් යන කරුණට අදාළ සිදුකරනු ලබන විමශර්නය, කොටුව මහේස්ත්‍රාත් උසාවියේ B 340/97/ 24." මේකේ කියනවා "එකී උක්ත ශීෂර්ය යටතේ ඔබ විසින් 2024.11.25 සහ 2025.10.24 දිනට එවන ලද උද්‍ධෘත සලකා බලන ලදී. එකී උද්‍ධෘතයන්ට අනුව සහ පොලිස් පරීක්ෂක පොල්වත්ත මහතා සමග පවත්වන ලද සාකච්ඡාවන්ට අනුව මේ වන තෙක් පැමිණිලි පාශර්වය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයන්හි මුල් පිටපත් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව තුළ සුරක්ෂිතව ගොනු කර ඇත්ද යන්න සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් වී නොමැත." ඔය වැනි කාරණා කීපයක් කියලා අවසානයේ කියනවා, "ඒ අනුව මෙම ගොනුව වසා දැමීමට පියවර ගන්නා බව මින් දන්වා සිටිමි." මොකක්ද කරලා තියෙන්නේ? සැකකාර ශානි අබේසේකරට එරෙහිව තිබුණු විමශර්නයේ ලිපි ගොනුව වසා දමන්නේය කියලා, සැකකාර ශානි අබේසේකරගේ අතිජාත මිත්‍ර දිලීප පීරිස් මහතා විසින්, අධ්‍යක්ෂක ශානි අබේසේකර මහතාට උපදෙස් දෙනවා. සැකකාර ශානි අබේසේකරගේ ලිපි ගොනුව වසා දමන්නයි, අධ්‍යක්ෂක ශානි අබේසේකරට උපදෙස් දෙන්නේ එකී ශානි අබේසේකරගේ කුළුපග මිත්‍ර දිලීප පීරිස් මැතිතුමා. හොරාගේ අම්මාගෙන් නෙවෙයි හොරාගෙන්ම තේද පේන අහලා තියෙන්නේ? ඔන්න ඕකයි අපි ශානි අබේසේකර මහත්තයාව ගෝඨාභය ආණ්ඩුව කාලේ රහස් පොලීසියේ අධ්‍යක්ෂක ධූරයෙන් ඉවත් කළේ.

එතකොට මෙතන සාධාරණ ප්‍රශ්නයක් මතු වෙනවා. පාස්කු සැකකරුවන්ටම විමශර්නය භාර දෙන්න කියලා ආණ්ඩුවට බල කරලා, පාස්කු විමශර්නය නොමඟ යවලා, සැබෑ අපරාධකරුවන් මතු වෙන එක වළක්වගන්න සිරිල් ගාමිණී පියතුමාට තිබුණු උවමනාව මොකක්ද? පාස්කු වින්දිතයන්ට ඉටුකරන්න පොරොන්දු වෙච්ච සාධාරණය මේකද කියන එක අපි සිරිල් ගාමිණී පියතුමාගෙන් ප්‍රශ්න කරනවා.

ඒ වගේම සිරිල් ගාමිණී පියතුමා ඊයේ මාධ්‍ය හමුවේදී හරි අපූරුවට ඉබ්‍රාහිම් නානා ආරක්ෂා කරලා කතා කරා. එතුමා කතා කරපු විදිහට මට හිතුනේ, ඉබ්‍රාහිම් නානා ජනාධිපති නීතිඥවරුන්ට මුදල් වැය කරන එකේ, සිරිල් ගාමිණී පියතුමාව තමන්ගේ නීති උපදේශක විදිහට පත් කර ගත්තා නම් ඔහුට ඉතාම ලේසියෙන් නිදොස් වෙන්න අවස්ථාව තියෙනවා කියලා.

දැන් මේ ආණ්ඩුව බලයට පැමිණියාට පස්සේ ඉබ්‍රාහිම් නානාගේ රජයට අත්පත් කරගත්ත දේපල භාරදීම අධිකරණයේ තීන්දුවක් කියලා එතුමා කියන කතාව ඇත්ත. හැබැයි අපි මතු කරන චෝදනාව වෙන්නේ, ඒ දේපල භාරදීමට තීරණය කරන්නේ දෙවරක් අවස්ථාව දුන්නත් රහස් පොලීසිය ඊට එරෙහිව කිසිම තොරතුරක් ගොනු කරන්න අසමත් වුණු නිසා. ඒ නිසා තමයි අපි කියන්නේ රහස් පොලීසිය නානාට වාසිදායක වන අයුරින් කටයුතු කරමින් ඉන්නවා කියන එක.

ඒ විතරක් නෙවෙයි, නානාට එරෙහිව තියෙන ප්‍රබලම සාක්ෂිය තමයි ගෙදර වැඩ කරන සේවිකාව. ඇය තමයි සාක්ෂි දුන්නේ පොලීසියට, නානා සහ පුතාලාගේ මේ අපරාධ ගැන දැනුවත්ව හිටියාය අනුබල දුන්නාය කියලා. ඇයගේ සාක්ෂිය මත තමයි නීතිපතිවරයා නඩු ගොනු කරන්න තීරණය කළේ. නමුත්, දැන් මේ 2025 මාතර්‍ු 24 වෙනිදා නඩුව කැඳවූවාම ගෙදර සේවිකාව විදේශ රැකියාවට ගිහිල්ලා ඇයගෙන් සාක්ෂි ගන්න විදියක් නැතැයි කියලා නීතිපති දන්වනවා. ඒ කියන්නේ, සිරිල් ගාමිණී පියතුමාගේ නීති සහාය නැතත් දැන් නම් නානා නිදොස් කොට නිදහස් වෙන්න අවස්ථාව ලැබිලා තියෙනවා.

එතුමා කියනවා, අපි සුරේෂ් සලේ මැතිතුමාට එරෙහිව සිදු කරන විමශර්න නතර කරන්නයි කියලා බලපෑම් කරනවා කියලා. මම සිරිල් ගාමිණී පියතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් අපි එහෙම කිව්ව තැනක් පෙන්නන්න. අපි විතරක් නෙවෙයි, එතුමාගේ ආදරණීය බිරිඳ මනෝරි සලේ මැතිනියවත් කියලා නැහැ විමශර්න නතර කරන්න කියලා. අපි ඉල්ලලා තියෙන්නේ වදහිංසා නතර කරන්න කියලා විතරමයි. විමශර්න සිදු කළ යුතුමයි කියලා බිරිඳත් කියනවා, අපිත් කියනවා. ඇයි? විමශර්න ඉදිරියටම ගියොත් තමයි ඔහුගේ නිදෙර්ෂී භාවය ඔප්පු වෙන්නේ. ආණ්ඩුව මේ කරන පාස්කු රංගනයේ ප්‍රෝඩාව හෙළිදරව් වෙන්නේ. ඒ නිසා ආණ්ඩුවට වඩා උවමනාවක් අපිට තියෙනවා මේ විමශර්නය ඉදිරියටම ගෙනියන්න. ආණ්ඩුවට උවමනා වුණේ අර රංග රාජපක්ෂ වගේ, කපිල චන්ද්‍රසේන වගේ මොහුටත් මානසික පීඩනයක් ඇති කරලා, වදහිංසා දීලා, සියදිවි හානිකර ගන්න තැනකට තල්ලු කරලා, මේ පාස්කු විමශර්නය නතර කරලා ඇඟ බේරගන්න. "දැන් ඉතින් මහ මොළකරු මියගියානේ, දැන් අපි කුමක් කරමද?" කියලා. ඒවට අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා අපි නැවත වරක් අභියෝග කරනවා සිරිල් ගාමිණී පියතුමනි, ඔබතුමා ඇත්තටම පියතුමෙක් නම්, ඇත්තටම දස පනත විශ්වාස කරනවා නම්, ඔබ කියන්නේ ඇත්තක් නම්, අපි කොතනද විමශර්න නතර කරනු කියලා කිව්වේ කියලා පෙන්නන්න. ඔබතුමා අඩුම ගානේ අපේ සත්‍යාග්‍රහයේ සටන් පාඨය මතක නම්, අපි මොකක්ද කිව්වේ? "විමශර්න පවත්වනු. සලේ ව ශානිගේ වදකාගාරයෙන් නිදහස් කරනු." වදකාගාරයෙන් නිදහස් කිරීම දෙවැනි ඉල්ලීම, පළවෙනි ඉල්ලීම තමයි, "විමශර්න පවත්වනු" කියන එක.

ඒ වගේම අපි කතා කරේ වදහිංසා ලබාදීමට එරෙහිව විතරයි. හැබැයි අපි වදහිංසා වලට එරෙහිව කතා කරන්න කතා කරන්න, හැම වතාවකම සිරිල් ගාමිණී පියතුමා ඇවිල්ලා අපට එරෙහිව කතා කරනවා. මොකක්ද ඒ කියන්නේ? එතුමා මාධ්‍ය හමුව පවත්වන්නේ අමානුෂික වදහිංසා සාධාරණීකරණයට. එතුමා පාස්කු විමශර්න කියන්නේ, වදහිංසා ලබාදීමට නම්, බලපෑම් කිරීමට නම්, ඔබ සුදු ලෝගුව ඇඳගෙන සිටින්නේ ජේසු සමිඳාණන්ගේ ප්‍රේමයේ පණිවිඩය ලොවට දෙන්නදැයි කියන එක ගැන අපිට ප්‍රශ්නයක් මතු වෙනවා. සුදු ලෝගුව, ජේසු සමිඳාණන් නියෝජනය කරමින්, ප්‍රේමයේ පණිවිඩය ලෝකයට ලබාදුන්නු,

ජේසු සමිදාණන්ව නියෝජනය කරමින් වෛරය වපුරන එක, වදහිංසා සාධාරණීකරණය කරන එකෙන් ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ පණිවිඩයට අපහාස කරන්න එපාය කියලා අපි සිරිල් ගාමිණී පියතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම එතුමා කියනවා, මේ මම ආගම්වාදීව කතා කරලා ආගමික ගැටුමක් නිමර්ාණය කරන්න හදනවා කියලා. මම කිව්වේ, සිරිල් ගාමිණී පියතුමනි, වසර 500 ක් බෞද්ධයන් සහ කතෝලිකයන් ඉතාම සමගියෙන් මේ පොළොවේ ජීවත් වුණා. ඔබ, මුස්ලිම් අන්තවාදීන් සිදුකළ බවට ජාත්‍යන්තර පරීක්ෂණ දෙකකින් සහ දේශීය විමශර්න කමිටු පහකින් තහවුරු කර තිබෙන අපරාධයක්, බෞද්ධයන් මත පැටවීමට දරන මේ උත්සාහය නිසාත්, මේ බොරුව ජනගත කිරීමට වදහිංසා ලබාදීම සාධාරණීකරණය කරන නිසාත්, බෞද්ධයන් සහ කතෝලිකයන් අතර ගැටුමක් මතුවීමේ අවදානමක් ඇවිත් තියෙනවා. ඒ සමගිය විනාශ කරන්න එපා, ඒ මහා පාපකමර්ය සිදුකරන්න එපා කියන එක තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලුවේ. ඒක, ආගම්වාදී කතාවක් බවට පත්වෙන්නේ කොහොමද කියන එකත් ඔබතුමාගේ දැනුම ඇසුරෙන් පැහැදිලි කරන්නැයි කියලා අපි සිරිල් ගාමිණී පියතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඇත්තෙන්ම දැන් මෙතුමා තමයි පැමිණිලිකරු. මෙතුමා තමයි විමශර්කයා පත් කර ගත්තෙත්, එතුමාම කියන විදිහට. සාමාන්‍යයෙන් විමශර්කයා අපක්ෂපාතී වෙන්න ඕනේ, පැමිණිලිකරුටවත් සැකකරුටවත් තමන්ගේ විමශර්කයා තීරණය කරන්න බැහැ. හැබැයි පැමිණිලිකරුත් එතුමලා, විමශර්කයෝ පත්කරන්නෙත් එතුමන්ලා. ඊට පස්සේ මාධ්‍ය හමුව පවත්වමින් විමශර්කයා පත්කිරීම සාධාරණීකරණය කරනවා 2024 ඔක්තෝබර් මාසයේ සිට. ඒ වගේම ඔවුන් කරන වැරදි වැඩ අනුමත කරනවා. මේක ආගමික සමගිය කෙසේ වෙතත්, සැබෑ කතෝලික බැතිමතුන්ට ඔබව එපාවීමට කාරණයක්ය කියන එක ගැන අපි සිරිල් ගාමිණී පියතුමාට අනතුරු ඇඟවීමක් කරනවා."